**2016 ඔක්තෝබර් 27 දින ඉන්දුනීසියාවේ බාලි හි දී පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ අමාත්‍ය මට්ටමේ රැස්වීමේ දී විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා කරන ලද කථාව**

ගරු අමාත්‍යවරුනි,

උතුමාණෙනි,

සම්භාවනීය නියෝජිතවරුනි,

ප්‍රථම කොටම, ඉන්දුනීසියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු රෙට්නො මාසුදි මැතිණියගේ ආදරණීය පියාණන් අභාවප්‍රාප්ත වීම සම්බන්ධයෙන් මාගේ දැඩි ශෝකය පළ කිරීමට කැමැත්තෙමි. මෙම ශෝකජනක අවස්ථාවේ එතුමිය හා එතුමියගේ පවුලේ සාමාජික සාමාජිකාවන් සමග අපි ද ශෝකය බෙදා හදා ගන්නෙමු.

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ අමාත්‍ය මට්ටමේ 16 වැනි රැස්වීම සඳහා මෙම අති රමණීය බාලි දූපතට රැස්ව සිටින සුවිශේෂී ආරාධිතයින් අතර ට මට ද එක්වීමට ලැබීම මාගේ ඉමහත් සතුටට හේතු වේ.

ඒ සම්බන්ධයෙන් ඉන්දුනීසියානු රජයේ විශිෂ්ට සූදානම මෙන්ම අප වෙත දක්වන ලද උණුසුම් ආගන්තුක සත්කාර වෙනුවෙන් අපගේ හදපිරි ස්තූතිය පළ කරමි.

ඉන්දුනීසියාවේ ඵලදායී හා ශක්තිමත් නායකත්වය යටතේ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ පොදු අරමුණු හා පොදු දැක්ම වෙත ළඟාවීමට මෙම රැස්වීම තුළින් අපට හැකියාව ලැබෙනු ඇතැයි අපගේ විශ්වාසයයි.

මීට පෙර මෙම සංවිධානයේ සභාපතිත්වය උසුලන ලද රටවල ද දායකත්වය බෙහෙවින් අගය කරන අතර මහලේකම්වරයා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය යොදන ලද ප්‍රයත්න වෙනුවෙන් ද අපගේ කෘතවේදීතාව හිමි වෙයි.

ඉන්දියානු සාගර කලාපයේ ගවේෂණ හා මුදවා ගැනීමේ සේවාවන්වල සහයෝගීතාව පිළිබඳ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ අවබෝධතා ගිවිසුමට අත්සන් කිරීමට ලැබීම සතුටට කරුණකි.

උතුමාණෙනි,

නිල් ආර්ථිකය, කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම හා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ ආයතනික ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීම

යන ක්ෂේත්‍රවල සතුටුදායක ප්‍රගතියක් අත්කර ගැනීමට පසුගිය වසර තුළදී හැකියාව ලැබිණි.

මේ අවස්ථාවේ, ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ සාමාජික රාජ්‍යයන්ට අදාළවන කාරණා කිහිපයක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරමි.

මගේ රටවන ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රාන්තයේ සිට ඇන්ටාක්ටිකාව දෙසට විහිදෙන කුඩා ගොඩබිම් ප්‍රමාණයක් නමුත් විශාල සාගරයකින් සැදුම්ලත් ඍජු මාර්ගයක් ස්වභාවිකව පිහිටා ඇත. නිල් ආර්ථිකය, ශ්‍රී ලංකාව ඇතුළු ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ සාමාජික රටවලට ඉතා වැදගත් වන ක්ෂේත්‍රයක් බවට පත්ව තිබේ. ඉන්දියානු සාගරය ආශ්‍රිත සම්පත් අප සතුවන අනර්ඝ වත්කම් අතර වෙයි. මෙම නිල් ආර්ථිකය හා සම්බන්ධ කටයුතුවලට, අප ජනතාවගේ ආර්ථික තත්වයන් සුවිශාල ලෙස ඉහළ නැංවීමට හැකියාවක් පවතියි.

එහෙයින්, සාගර විද්‍යා හා පරිසරය පිළිබඳ විශිෂ්ටතා කේන්ද්‍රය ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම කාලෝචිතය. මෙම කේන්ද්‍රස්ථානය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක මට්ටමේ නොවුවද, අනෙකුත් කරුණු අතර කලාපයේ ඊට සම්බන්ධ ආයතන හා විශේෂඥයින්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා මෙන්ම දැනුම් කේන්ද්‍රස්ථානයත් ලෙසද ක්‍රියාත්මක වනු ඇත.

මෙම වසරේ කොළඹ දී පැවති මෙම සංවිධානයේ තල්මසුන් හා ඩොල්පින් මත්ස්‍යයින් නැරඹීමේ වැඩමුළුව, මෙහි සාමාජික රටවල් අතර සබඳතා වැඩිදියුණු කිරීමට තුඩුදුන් අතර එය, තල්මසුන් හා ඩොල්ෆින් මත්ස්‍යයින් නැරඹීම ආශ්‍රිත තිරසාර සංචාරක කටයුතු සම්බන්ධයෙන් අප සතු විශේෂඥ දැනුම පුළුල් කිරීමට ඉවහල් විය.

තවද, පිළිවෙළින් නොවැම්බර් 15-16 හා 17-18 දිනවල, ඉන්දියන් සාගර මෙහෙයුම් පද්ධතිය සඳහා කොළඹදී පැවැත්වීමට නියමිත දෙවන ජල කර්මාන්ත වැඩමුළුවට හා සාගර පිළිබඳ පූර්ව නිවේදනය හැකියා වර්ධන වැඩමුළුවට ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානයේ සියළුම රටවල් සහභාගී වනු ඇතැයි අපි බලාපොරොත්තුවෙන් සිටිමු.

උතුමාණෙනි,

2015 වර්ෂයේ දී පැවැති ජනාධිපතිවරණයෙන් හා පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව ජාතික රජය පිහිටුවීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රෙක්ෂාවලියෙහි විශාල වෙනස්කම් සිදුවී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය සහ එහි ව්‍යුහයන් සඳහා මෙන්ම

ආර්ථික ප්‍රගතිය ශක්තිමත් කිරීමේ අපේ පොදු එකඟත්වයෙන් යුත් පාලනය පදනම් වී ඇත්තේ විවෘත හා විනිවිද භාවයෙන් යුත් න්‍යාය පත්‍රයක් මතය.

සීමාවෙන් ඔබ්බට පැතිරගොස් කටයුතු කිරීම අපේ නව විදේශ ප්‍රතිපත්තියේ තථ්‍යාංක ලෙස හුවා දැක්විය හැක. මේ අනුව ශ්‍රී ලංකාව අධ්‍යාපනය, මානව සම්පත් සංවර්ධනය, සෞඛ්‍යය යන ක්ෂේත්‍රවලදී අපේ දක්ෂතා බෙදා හදා ගැනීමට කටයුතු කෙළෙමු. එම අංශවලදී අපි එක්තරා විශිෂ්ඨතා මට්ටමකට එළඹ සිටිමු.

ලෝක ආර්ථිකයට වැඩියෙන් සමෝධානය වීමේ තත්වයක් උදාකර ගැනීමේ අරමුණෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳාමට විවෘතව සිටීමත් ආයෝජකයාට හිතකර වාතාවරණයක් ඇතිකර ගැනීමත් සඳහා කටයුතු කරමින් සිටී.

සම්භාවනීය නියෝජිතවරුනි,

ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානයේ 20 වන සාංවත්සරය සමරණ එම සංවිධානයේ 2017 මාර්තු මාසයේදී පවත්වනු ලබන සමුළුවට සහභාගීවීමට අපි බලාපොරොත්තුවෙන් සිටිමු. සමුද්‍රය කටයුතු වලදී සුරක්ෂිතතාව හා ආරක්ෂාව උදාකර ගැනීම වෙළඳ හා ආයෝජන පහසුකම් සලසා ගැනීම, සංස්කෘතික ශාස්ත්‍රීය, විද්‍යාත්මක හා තාක්ෂණික හා ධීවර කටයුතු දියුණු කරගැනීම, ආපදා අවදානම් කළමනාකරණය කර ගැනීම සහ වෙනත් අරමුණු ගණනාවක් අරභයා අපි ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානයේ කාර්යභාරය ශක්තිමත් වනු ඇතැයි අපි විශ්වාසයෙන් සිටිමු. වඩාත් ගතික, ක්‍රියාකාරිත්වයට නැඹුරු කලාපීය සහයෝගීතාවක් අරභයා අපේ ප්‍රගතිය මැන ඒ අනුව සටහනක් සකස් කර ගැනීමට අපට අවශ්‍යව ඇත. ශක්තිමත් ආරම්භකයන් උදාකරන ක්‍රියාකාරී සැලැස්මක් සහිත දූරදර්ශී ප්‍රලේඛයක් සකස් කර ගැනීම සඳහා සුසංගමය අත්‍යාවශ්‍ය යැයි අපි විශ්වාස කරමු.

ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානය ගතික නව යුගයක් කරා සේන්දු වන්නේයැයි ශ්‍රී ලංකාව බලාපොරොත්තු තබාගෙන සිටී.

ඒ අනුව පහත සඳහන් කරුණු සඳහා අපි සාමූහික පියවර ගත යුතුව ඇත්තෙමු.

- නාවික ගමනාගමණය සඳහා නිදහස, රටවලට ඉහළින් පියාසර කිරීමේ නිදහස සහ සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ඇතුළු ජාත්‍යන්තර නීතිය පිළිපැදීම ආදී වශයෙන් ඉන්දියන් සාගරයේ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීම සඳහා,
- ඉන්දියන් සාගර වටද්දර රටවල් අතර විද්‍යාත්මක හා ශාස්ත්‍රීය සහයෝගීතාව තහවුරු කර ගැනීම සඳහා,

- ජාත්‍යන්තර නීතිය සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක මගින් මාර්ගෝපදේශකත්වය සලසාගෙන අගනා සමුද්‍රීය සම්පත් ආරක්ෂා කර ගැනීම, සංරක්ෂණය කර ගැනීම හා තිරසාර භාවිතය සඳහා,
- සමුද්‍රය ආශ්‍රිතව සිදුවන ආපදාකාරී තත්ත්වයන් සඳහා සමුද්‍රීය කාලගුණය අනුව සිදුවන දේශගුණික විපර්යාස පිළිබඳව තක්සේරු නොකළ බලපෑම් පිළිබඳව කටයුතු කිරීමට සූදානම සඳහා,
- ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානය තුළ මූල්‍ය සංවර්ධනය සඳහා යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම සඳහා,
- වඩාත් ශක්තිමත් හා අර්ථවත් සහයෝගීතාවක් සඳහා ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානයේ සාමාජිකයන් අතර ව්‍යාප්ත හා පුළුල් පදනමක් ඇතිකර ගැනීම සඳහා,

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය එහි 20 වැනි සංවත්සරය අභිමුවට පැමිණ ඇති හෙයින්, මෙම සංවිධානයේ අනාගත වැඩපිළිවෙළ සැලසුම් කිරීම සඳහා නව දැක්මක් සැකසීමේ අරමුණින් යුතුව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කාලය එළඹ තිබේ. අන්තර්ක්‍රියා හා සහභාගිත්වය වැඩි වැඩියෙන් සිදුවීම දිරිමත් කිරීම සඳහා අපගේ සංවාද පාර්ශ්වකරුවන් සමඟ වඩාත් ඵලදායී අන්දමින් කටයුතු කිරීම හා යාන්ත්‍රණ පිළිබඳව සොයාබැලීම මීට ඇතුළත්විය යුතුය.

උතුමාණෙනි, සම්භාවනීය අමුත්තනි,

මෙම සංවිධානය තවදුරටත් ශක්තිමත් කරන, හා ජාත්‍යන්තර සංවිධාන ජාලයේ මෙම සංවිධානයට හිමි ස්ථානය පිළිබඳව තක්සේරු කරන විධික්‍රම හා නව සර්ව ශුභවාදී ආකල්ප හා එය සතුවන ශක්තියත් ප්‍රයෝජනයට ගනිමින් සාමාජික රටවල් සියල්ලේම අන්‍යොන්‍ය යහපත තකා වැඩි වැඩියෙන් කටයුතුවල නියැලීමට ඇති හැකියාවන් පිළිබඳව ඵලදායී සංවාදයක් පැවැත්වීමට හා අන්තර්ක්‍රියා සිදුකර ගැනීම මාගේ අපේක්ෂාවයි.

උද්යෝගී ක්‍රියාකාරිත්වයෙන් යුතු නව යුගයක් කරා මෙම සංවිධානය කැඳවාගෙන යාමේදී ශ්‍රී ලංකාව සතු කාර්යභාරය අඛණ්ඩව ඉටුකරනු ඇත.

ස්තූතියි.

***